සම්ප්‍රදායයන් ගළපාගත නොහැකිව අතරමං වන අවස්ථා ද ඇත. මෙහිදී තම තරුණ දූ දරුවන් අසහනයකට පත් නොකරන්නට වැඩිහිටියෝ වගබලාගත යුතු වෙති. පවුලක් තුළ දරුවන් ලබන සමාජානුයෝජනය බාල වියේදී පටන්ම සිදු විය යුතු වෙයි. දරුවකුට තමන් පිළිබඳ ස්ථාවරය, තමන් හා අන් අය සමග ඇති සබඳතා යන මේවා අවබෝධ කරගැනීමට කුඩා අවදියේ පටන්ම අවස්ථාව සැලසිය යුතු වෙයි. එම ක්‍රියාවලියේදී දෙමාපිය වැඩිහිටියන්ට, තම සංස්කෘතික සාරධර්ම ගැන, සාම්ප්‍රදායික උත්සව හා සිරිත් විරිත් ගැන දරුවන්ට පහදා දීමට හැකි වනු ඇත. එවන් පසුබිමක හැදෙන වැඩෙන දරු පරපුරක් තාක්ෂණික ලෝකයේ ඉදිරියට යද්දී වුවද, තමන් ලබා ඇති සාම්ප්‍රදායික ඥානය හා හුරුව අත් නොහැරම, සමබර ලෙස පවත්වාගෙන යාමට සමත් කමක් පෙන්වනු ඇත.

ශ්‍රී ලාංකික සමාජය තුළ, විශේෂයෙන්ම බුදු දහම අදහන සිංහල ජනතාව අප්‍රේල් මාසයට යෙදෙන අලුත් අවුරුද්ද හුදෙක් සම්ප්‍රදායෙන් බැහැරව ඉටු කරන අවස්ථා මෙන්ම එසේ නොකරන අවස්ථා ද වර්තමානයේදී දැකගත හැකිය. ශ්‍රී ලංකාවේ නූතන නාගරික සමාජය තුළ ජීවත් වන බොහෝ දෙනා ගැමි පසුබිමක් සහිත වූවන් බව පැහැදිලි කරුණකි. අලුත් අවුරුද්ද යෙදෙන අප්‍රේල් මාසයේ අවුරුදු නිවාඩු දින කීපය අගනුවර ජනශූන්‍ය බවට පත් වන තරම්ය. එසේ වන්නේ ද ගමෙන් නගරයට විත් ජීවත් වන්නන්, අවුරුද්දට ලැබෙන නිවාඩුවේදී ගමරට බලා යාම හේතුවෙනි. මේ අතුරෙන් ඇතමුන් එම නිවාඩුවේදී ගැමි පෙදෙස්වල ජීවත්වන තම වැඩිහිටියන් බැලීමට දරුවන් ද කැටුව ගමට යනු වෙනුවට නුවරඑළිය වැනි ස්ථානවලට ගොස් විවේකයෙන් හා විනෝදයෙන් කල් ගෙවීම ද අද අරුමයක් නොවේ. කෙසේ වුවද නාගරික වැසියන් අතුරෙන්, සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර අගයන බොහෝ දෙනා තම දරු පවුල් ද කැටුව ගමේ සිටින වැඩිහිටියන් බැලීමට යන අවස්ථා බහුලය. මෙවන් අවස්ථා සැබවින්ම එම නාගරික දෙමාපියන්ට ද තම දරුවන්ට අවශ්‍ය සාම්ප්‍රදායික දැනුම මඳ වශයෙන් හෝ ලබා දීමට ඉඩ ප්‍රස්තා සලසනු ඇත.

සම්ප්‍රදාය හා නවීනත්වය අතර අතරමං වී සිටින තරුණ පරපුර එම අසරණ තත්වයෙන් මුදවා ගැනීමේ වගකීම ද වැඩිහිටි පිරිසට භාර වෙයි. අලුත් අවුරුදු සමයේදී සිංහල ජනතාව තම චාරිත්‍ර වාරිත්‍ර අනුවත්, දෙමළ ජනතාව ඔවුන්ගේ ද අගනා චාරිත්‍ර වාරිත්‍ර අනුවත් කටයුතු කරනු දැකගත හැකිය. ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය හා සංහිඳියාව වර්ධනය විය යුතුව ඇති මෙවන් සමයක සිය දරුවන්ට එම දෙකොට්ඨාසයෙහිම සිරිත් විරිත් ගැන කියා දෙන්නට වැඩිහිටියන් ඉඩ සලසාගැනීම වැදගත් කරුණකි.

අවුරුදු චාරිත්‍ර යනු කාලාන්තරයක් තිස්සේ ශ්‍රී ලාංකික ජනයා විසින් පවත්වාගෙන එනු ලබන ක්‍රියා පද්ධතියකි. මෙරට අලුත් අවුරුදු උත්සවය පිළිබඳව ඓතිහාසික තොරතුරු සොයා බැලීමේදී එහි ප්‍රභවය පණ්ඩුකාභය රජු දවස වන්නට ඇතැයි සිතිය හැකි සාක්ෂි මහවංසයෙන් සොයාගත හැකිය. 'නැකැත් කෙළි' දවස්හි මහරජ, චිත්‍රරාජයා සමග අසුන් ගෙන දෙව් මිනිස් නැටුම් කරවමින් ප්‍රීති වූ බවක් කියවෙයි. ඒ අනුව මෙම උත්සවය ඈත අතීතයේදී මිනිසුන් විනෝදයෙන් ගත කළ නැකැත් කෙළි උත්සවයක් ලෙස පැවති බව සිතාගත හැකිය. සිංහල අවුරුද්දේ පැරණිතම අවස්ථාව මෙය විය හැකි බව සිතන්නට ඉඩ ඇත. සශ්‍රීකත්වය පතා සූර්ය දෙවියන් පිදීමත් වසන්ත උත්සව පැවැත්වීමත් මෙහි අරුත වන්නට ඇත.

එම පැරණි අවධිය පිළිබඳව ලැබෙන තොරතුරුවලට පසුව, රොබට් නොක්ස් තබා ඇති සටහන් අනුව, මාර්තු මස 27, 28 හෝ 29 යන දිනවලින්, නැකැත් කරුවන් තෝරා දෙන එක් ශුභ දිනයකදී මෙවන් උත්සව පැවැත්වූ බවක් පෙනේ. එදිනට රජතුමා රජවාසල තොරණ යොදා අලංකාර කරවීමක් ගැන ද රජතුමා හිස් සෝදා ස්නානය කොට සැරසී අවුත් එම නැකැත් කෙළියට සහභාගී වූ බවක් මේ තොරතුරු අනුව සිතාගත හැකිය. මුල්ම අවස්ථාවේදී හුදෙක් වසන්ත උත්සවයක් ලෙස පැවත අවුත් පසු කල බුදුදහමේ ආහාසයෙන් බෞද්ධ මුහුණුවරක් ද ගනිමින් විකාශය වී අද වන විට අප්‍රේල් මස මැදදී සිංහල බෞද්ධ ජනතාවට විශේෂ වූ උත්සවයක් බවට පත් වී ඇත. අද වන විට අප්‍රේල් මස 13, 14 වැනි දිනයක සිංහල අලුත් අවුරුද්ද සමරනු ලැබේ.

පිළිවෙළින් පරණ අවුරුද්ද, නොනගතය, ලිප ගිනි දැල්වීම, කිරිබත් පිසීම, ආහාර අනුභවය, ගනුදෙනුව, වැඩ ඇල්ලීම මෙන්ම නැකතට හිස තෙල් ගෑම, රැකී රක්ෂා සඳහා පිටත්ව යාම යන එක් එක් අවස්ථාවලට ශුභ මොහොතින් රට තුළ අවුරුදු සිරිත් අනුගමනය කරන සියල්ලන්ම එකම මොහොතකදී එම චාරිත්‍ර ඉටු කිරීමට යොමු වන සේ කටයුතු සම්පාදනය වෙයි. මෙවන් චාරිත්‍රවල සාම්ප්‍රදායික බවත් ඒවා පෙර පටන් පැවත ආ සිරිත් විරිත් බවත් ඒවා පිළිපැදීමෙන් ඉටු වන යහපත ගැනත් තම දරුවන්ට කියා පහදා දීම වැඩිහිටියන් අතින් ඉටු විය යුතු අවශ්‍ය කාර්යයකි.

අලුත් අවුරුද්ද එකම දිනයක සමරන ශ්‍රී ලාංකික සිංහල දෙමළ දෙකොට්ඨාසයම එක් අතකින් බලන විට සූර්ය වන්දනාවක් ලෙස මෙන්ම වසන්තය හා බැඳුණු සශ්‍රීකත්වය භුක්ති විඳින, ඒ වෙනුවෙන් සංකේතාත්මකව චාරිත්‍ර ඉටු කරන උත්සවයක් ලෙස ද මෙය සැලකිය හැකිය. සිංහල අලුත් අවුරුදු සිරිත් හා දෙමළ ජනතාව එදිනට චාරිත්‍ර ඉටු කරන ආකාරය අතර වෙනස්කම් දක්නට ලැබුණද මූලික ආකල්ප අතින් මේවායේ කිසියම් සමානත්වයක් දැකගත හැකිය. පවුලක් වශයෙන් ජීවත් වීමේදී පවුල තුළ සිදු කෙරෙන එදිනෙදා කටයුතුවල තිබෙන ඒකාකාරී බවෙන් වෙන්ව කිසියම් ආකාරයක ආනන්දජනක සිතුවිලිවලින් සිත්සතන් පිරී ඉතිරී යන උත්සව අවස්ථාවක් ලෙස අලුත් අවුරුදු සමය සැලකිය හැකිය. නවීනත්වය සමග සම්ප්‍රදාය එකිනෙකට ගළපාගෙන මෙම සිරිත් විරිත් අනුගමනය කිරීම නූතන ශ්‍රී ලාංකික ජනතාවට කිසිසේත්ම අපහසු නොවිය යුතුය.

කවර රටක හෝ සංස්කෘතිය මෙන්ම ඊට අදාළ සම්ප්‍රදායයන් ද කලින් කලට වෙනස් වන බව සත්‍යයකි. ලොව කිසිදු සංස්කෘතියක් ඒකාකාර ලෙස, එකම තැන පවතින්නක් නොවේ. වෙනස් වීම සංස්කෘතියක දිගුකල් පැවැත්මට අත්‍යවශ්‍ය වෙයි. එම සනාතන ධර්මතාව අනුව ගෙන බලන විට සිංහල අලුත් අවුරුදු සිරිත් විරිත් ද එදා මෙදාතුර මේ අයුරින් හෝ නොනැසී පවතින්නේ ඒවා තුළ කාලෝචිත වෙනස්වීම් ද සිදු වී ඇති හෙයිනි.

ශ්‍රී ලාංකික සමාජය හා සංස්කෘතික සිරිත් විරිත් ඇසුරෙන් ගෙන බලන විට වර්තමානයේ ද මෙරට ජනතාව අලුත් අවුරුද්ද වැනි විශේෂ අවස්ථා ඉතා උනන්දුවෙන් සමරන බව පෙනේ. බොහෝ දියුණු රටවල තරමටම තාක්ෂණික දියුණුවක් අප සතු නොවුවද, ලෝකයේ සිදු වෙමින් පවතින නානාවිධ දියුණු තාක්ෂණික අංග අප රටට ද අදාළ වෙමින් පවතී. එවන් වර්තමානයක සිට සම්ප්‍රදාය රැකගැනීම ගැන සිතන විට පෙර පැවසූ පරිදි, බුද්ධිය හා හැඟීම් අතර සමතු-ලිත බව පවත්වා ගැනීමට වෙර දරන ජාතියකට එය කිසිසේත්ම අපහසු කටයුත්තක් නොවන බව පැහැදිලිය. සිංහල අලුත් අවුරුදු සිරිත් විරිත්වල මූලික ලක්ෂණ ලෙස දක්නට ඇති, අලුත් වීම, සතුට, එකමුතුකම, අන්‍යෝන්‍ය ගරුත්වය, ආගන්තුක සත්කාරය, කළගුණ සැලකීම ආදී අගනා අංගෝපාංග වර්තමානයේ ජීවත් වන වැඩිහිටි පරපුරට පමණක් නොව බාල පරපුරට ද පහසුවෙන් විෂය විය යුතුය. ඒ අනුව අපේ සාම්ප්‍රදායික සිරිත් විරිත් නූතන චින්තනයට පටහැනි නොවන පරිදි ක්‍රියාත්මක කිරීමට හොඳටම ඉඩකඩ ඇති බවද කිව යුතුය.

සිංහල අලුත් අවුරුදු සමය එම ජනතාවට අමුතු ජීවයක් ලබා දෙන විශේෂ කාල සීමාවකි. ඒ සමගම රූපවාහිනිය, ගුවන්විදුලිය වැනි විද්‍යුත් මාධ්‍ය මගින් මෙන්ම මුද්‍රිත මාධ්‍ය මගින් ද අලුත් අවුරුද්ද පිළිබඳව දක්වන උනන්දුව සමාජයට ප්‍රබල ලෙස දැනෙන්නකි. එක් අතකින් බලන විට අලුත් අවුරුදු සමය ව්‍යාපාරික ලෝකයේ අමුතුම උද්යෝගයක් ඇති කරවන බැවින් රූපවාහිනිය වැනි මාධ්‍ය මගින් දෙවැදෑරුම් පරමාර්ථ ඉටු කරගැනීමට වෙළඳ ව්‍යාපාරිකයන් දරන උත්සාහය ද පැහැදිලිවම දිස් වන්නකි.

කෙසේ නමුදු, නූතන නාගරික ජන සමාජයට, විශේෂයෙන්ම බාල පරපුරට අලුත් අවුරුද්ද ගැන යළි යළිත් මතක් කර දීමක් ද ජනමාධ්‍ය මගින් වසරක් පාසා ඉටු වන ආකාරය පිළිබඳව සාධනීය ආකල්ප සමාජය තුළ පවතින බව පෙනේ. අලුත් අවුරුදු සිරිත් විරිත් සාම්ප්‍රදායික ගැමි සංස්කෘතික පරිසරයට සීමා වන්නට ඉඩ නොතබා සමස්ත සමාජය තුළම ඒ පිළිබඳ උද්යෝගයක් හා මතකය අලුත් කර ලීමක් දිගින් දිගටම පැවතීමේ අවශ්‍යතාව ද මෙහිදී අපි සිහියේ තබාගත යුතු වෙමු. අවුරුදු සිරිත් විරිත්, අවුරුදු ක්‍රීඩා, විශේෂ අවුරුදු ආහාරපාන වර්ග මෙන්ම පවුල තුළ අන්‍යෝන්‍ය සම්බන්ධතා තහවුරු කර ලීමට උපකාරී වන යහපත් පිළිවෙත් ද අලුත් අවුරුදු කාල සීමාව තුළ දී මුළු රටටම මතක් කර දෙන අතරම, ඒ සියල්ලහි ගුණාත්මක භාවය රැකගැනීමට ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ අවධානය යොමු වීම අත්‍යවශ්‍යය. සම්ප්‍රදාය යනු හුදෙක් කල් ගත වූ පසුව බැහැර කළ යුත්තක් නොවේ. විවිධ ආකාරයෙන් දියුණු වෙමින් පවතින තාක්ෂණික ලෝකය තුළ සම්ප්‍රදායයන්හි අවශ්‍යතාව අප කාගේත් සිත්වල සනිටුහන් වී තිබිය යුත්තකි.

**IMMIGRATION LAW @**
**Australian Immigration Law firm of the Sri Lankan Community**

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*